125)

# 9 වසර තාක්ෂණික සහතික පත්‍ර පාඨමාලාවේ ගිණුම්කරණය විෂය නිර්දේශයෙන් ඉදිරිපත් කරන සංකල්ප සාධනය පිළිබඳ විෂමතා ඇතිකිරීම කෙරෙහි බලපා ඇති සාධක පිරික්සීම. (ගම්පහ දිස්ත්‍රික්කය ඇසුරෙන්)

අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන නිබන්ධනය.

අධ්‍යාපන පීඨය

කොළඹ විශ්ව විද්‍යාලය.

UCLIB
453116

පී.කේ.සෝමසිරි
වාණිජ විද්‍යාවේදී උපාධිය (දෙවන පෙළ)
අධ්‍යාපන ඩිප්ලෝමා (සම්මාන)

1995

University of Colombo
Library
Sri Lanka

## සාරාංශය.

1978 සිට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විවෘත වෙළෙඳපොළ ආර්ථික ක්‍රමය නිසා මෙරට ජීවත්වන සෑම පුද්ගලයකුම තරඟකාරී වාණිජමය ජීවන රටාවකට මුහුණ දෙමින් සිටී. එම තරඟකාරී තත්ත්වයට සාර්ථකව මුහුණ දීමට නම් සාමාන්‍ය වාණිජ දැනුමක්ද ප්‍රායෝගික හැකියාවක් ද සෑම පුද්ගලයකු විසින් ම ලබාගත යුතුය. එසේ නොමැති පුද්ගලයකු ප්‍රායෝගික ගනුදෙනු වලදී නොයෙකුත් දුෂ්කරතාවන්ට මුහුණ දේ.

මෙම විවෘත ආර්ථික ක්‍රමය හේතුකොට ගෙන වාණිජ ක්ෂේත්‍රයේ ශීඝ්‍ර ප්‍රසාරණයක් ඇතිවූ අතර ඒ ආශ්‍රිත රැකියා අවස්ථා ද බහුලවන්නට විය. එම අවශ්‍යතාව පිරිමැසීම සඳහා විද්‍යා අධ්‍යාපනය මෙන් වාණිජ අධ්‍යාපන ක්ෂේත්‍රය ද ප්‍රායෝගික කිරීමේ අවශ්‍යතාව මතුවන්නට විය. එවැනි එක් ප්‍රයත්නයක් වශයෙන් 1991 දී හඳුන්වා දෙන ලද 9 වසර තාක්ෂණික සහතික පත්‍ර පාඨමාලාව පෙන්වා දිය හැකිය. ඒ යටතේ හඳුන්වා දෙනු ලැබූ ගිණුම්කරණය විෂය මඟින් සිසු දරුවන් වෙත ඉදිරිපත් කරන සංකල්ප නිසි පරිදි සාධනය වී තිබේද? සාධන විෂමතා ඇතිකිරීම සඳහා බලපෑ සාධක කවරේද? යන්නත් මෙම අධ්‍යයනය මඟින් පරීක්ෂා කර බලන ලදි. ඒ සඳහා යොදා ගන්නා ලද සුවිශේෂ අරමුණු හය පහත දැක්වේ.

1. 9 වසර තාක්ෂණික සහතික පත්‍ර පාඨමාලාවේ ගිණුම්කරණය විෂය ආශ්‍රිත සංකල්ප සාධනය කෙරේ සිසුන්ගේ ගණිත හැකියාව වෙසෙසි වෙනසක් ඇති කරන්නේ දැයි පිරික්සීම.

2. 9 වසර තාක්ෂණික සහතික පත්‍ර පාඨමාලාවේ ගිණුම්කරණය විෂය ආශ්‍රිත ගණිතමය සංකල්ප හා ගණිතමය නොවන සංකල්ප සාධනයෙහි ලා වෙසෙසි වෙනසක් ඇති කරන්නේ දැයි පිරික්සීම.


University of Colombo Library Sri Lanka

3. 9 වසර තාක්ෂණික සහතික පත්‍ර පාඨමාලාවේ ගිණුම්කරණය විෂය ආශ්‍රිත සංකල්ප සාධනය කෙරෙහි රජයේ සහ පෞද්ගලික පාසල් අතර වෙසෙසි වෙනසක් ඇතිවන්නේ දැයි පිරික්සීම.

4. 9 වසර තාක්ෂණික සහතික පත්‍ර පාඨමාලාවේ ගිණුම්කරණය විෂය ආශ්‍රිත සංකල්ප සාධනය කෙරෙහි ලිංග භේදය වෙසෙසි වෙනසක් ඇති කරන්නේ දැයි පිරික්සීම.

5. 9 වසර තාක්ෂණික සහතික පත්‍ර පාඨමාලාවේ ගිණුම්කරණය විෂය ආශ්‍රිත සංකල්ප සාධනය කෙරෙහි සමාජ ආර්ථික තත්ත්වය වෙසෙසි වෙනසක් ඇති කරන්නේ දැයි පිරික්සීම.

6. 9 වසර තාක්ෂණික සහතික පත්‍ර පාඨමාලාවේ ගිණුම්කරණය විෂය ආශ්‍රිත සංකල්ප සාධනය කෙරෙහි ග්‍රාමීය හා නාගරික බව වෙසෙසි බලපෑමක් ඇති කරන්නේ දැයි පිරික්සීම.

මෙම අරමුණු පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය දත්ත රැස්කරගැනීමට භාවිතා කළ නියැදිය, පර්යේෂණ උපකරණ සහ දත්ත විශ්ලේෂණය සඳහා භාවිතා කළ සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රම ශිල්ප පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

1. ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ රජයේ සහ පෞද්ගලික පාසල් වල 9 වසර ගිණුම්කරණය විෂය හදාරන සිසුන් ජනගහනය වශයෙන් සලකා තෝරාගත් පාසල් කීපයකින් අහඹු ස්ථරගත ක්‍රමයට සිසුන් 400 ක නියැදියක් ලබා ගැනීම.

2. පර්යේෂණ උපකරණ වශයෙන් ශිෂ්‍ය සාධනය මැනීම සඳහා වනු 40 කින් යුත් බහුවරණ ප්‍රශ්න පත්‍රයක් යොදාගත් අතර එහි විශ්වසනීයතාව 0.67 ක් වේ. ශිෂ්‍යයාගේ සමාජ ආර්ථික තත්ත්වය සෙවීම සඳහා ප්‍රශ්නාවලියක් ද භාවිතා කිරීම.

3. ඉහත පර්යේෂණ උපකරණ මගින් රැස්කරගත් දත්ත විශ්ලේෂණය කිරීම සඳහා එක්පැති විසැලි විශ්ලේෂණය, සහසම්බන්ධිත සංගුණකය, ප්‍රතිපායනය සහ මධ්‍යනයයන් අතර වෙනස පිළිබඳ තියදි මධ්‍යනයය ව්‍යාප්තිය සහ සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රමශිල්ප භාවිතා කිරීම.

මෙම අධ්‍යයනය තුළින් එළඹෙන ලද නිගමනයන් මෙසේය:

1. 9 වසර ගිණුම්කරණය විෂය නිර්දේශයෙන් ඉදිරිපත් කරන ලද සංකල්ප සාධනය කෙරෙහි සිසුන්ගේ ගණිත හැකියාව වෙසෙසි බලපෑමක් කරන බව,

2. 9 වසර ගිණුම්කරණය විෂය නිර්දේශයෙන් ඉදිරිපත් කරන ලද ගණිතමය සංකල්ප හා ගණිතමය නොවන සංකල්ප සාධනයෙහි ලා වෙසෙසි වෙනසක් පවතින බව,

3. 9 වසර ගිණුම්කරණය විෂය නිර්දේශයෙන් ඉදිරිපත් කරන ලද සංකල්ප සාධනය කෙරෙහි රජයේ සහ පෞද්ගලික පාසල් අතර වෙසෙසි වෙනසක් පවතින බව,

4. 9 වසර ගිණුම්කරණය විෂය නිර්දේශයෙන් ඉදිරිපත් කරන ලද සංකල්ප සාධනය කෙරෙහි ලිංග භේදය වෙසෙසි බලපෑමක් කරන බව,

5. 9 වසර ගිණුම්කරණය විෂය නිර්දේශයෙන් ඉදිරිපත් කරන ලද සංකල්ප සාධනය කෙරෙහි සමාජ ආර්ථික තත්ත්වය වෙසෙසි බලපෑමක් කරන බව,

6. 9 වසර ගිණුම්කරණය විෂය නිර්දේශයෙන් ඉදිරිපත් කරන ලද සංකල්ප සාධනය කෙරෙහි ග්‍රාමීය හා නාගරික බව වෙසෙසි බලපෑමක් කරන බව.